ප්‍රශංසා එකතු සුපවත
2018 ජනවාරි මස 22 වන දින සිට ජනවාරි මස 28 වන දින දක්වා
**විශ්වාසය ජීවමානයි**

01. ප්‍රශංසාව සඳහා :

* යාච්ඤාව විශ්වාසාලෝකය වර්ධනය කර ගැනීමට අවැසි මූලික පරිසරයකි. කුඩා දරුවෙකුට තෑග්ගක් ලැබෙන විට දෝතින් බදා ගන්නා සේ විශ්වාසය නමැති ත්‍යාගය දෙවියන් වහන්සේ අතින් භාර ගෙන අප ගත සිත මනස හා ආත්මය යන සෑම අංගයකටම ඇතුළු කර ගන්නා තරමට මෙම අමිල ත්‍යාග තුළ ප්‍රීතිවන තරමට, ඒ ගැන ප්‍රශංසා කරන තරමට, විශ්වාසය ජීවමාන බව අතදකින්නට හැකිවේ.

* 1තෙසලෝනික 5:16-17 **"නිතරම ප්‍රීතිවන්න, නොකඩවා යාච්ඤා කරන්න. සියල්ලේදී ස්තූති දෙන්න. ක්‍රිතුනුවන් වශයෙන් දෙවියන් වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන්නේ මෙය වේ."**

* පුබුදු ගී 103 "තුති ප්‍රශංසා වේ ...."

02. පසුගිය සතියේ අත්දැකීම් සාංඝික කර ගනිමින්, කෙටි ප්‍රශංසාවකට ඇතුළු වන්න.

03. සතියේ සුපුවත :

* විශ්වාසය පණ නැති දෙයක් නොවේ. ජීවමාන දෙයකි. විශ්වාසය බීජයක් මෙන් වැඩෙමින් බොහෝ සේ ඵල දරයි. ඵල දැරීමට නම් ඊට සුදුසු පරිසරයක් අත්‍යවශ්‍යයය.

i විශ්වාසය ජීවමාන බැවින්, එය කෙමෙන් කෙමෙන් වැඩෙන දෙයකි. එසේ නම් විශ්වාසයේ තෑග්ග අප විසින් වැඩි වර්ධනය කරගන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. ඒ සඳහා ගතයුතු පියවරයන් මොනවාදැයි බෙදා ගන්න.
ii එසේම විශ්වාසයේ බලය ඉතා ගැඹුරින් අත්දුටු අවස්ථාවක් ගැනද බෙදා ගන්න.

04. වචනයේ සේවකයා සඳහා :

(අ) ඔබ පොතක් කියවන විට එය මහත් සැලකිල්ලෙන් කියවනවා නම්, එහි ඇති දැනුම ඔබට අයිති වේ. සැලකිල්ලෙන් පමණක් නොව, එම විෂය කෙරෙහි ආදරයකින් යුතුව කියවනවා නම්, එහි දැක්ම ඔබට වඩාත් අයිති වේ. එලෙසම දෙවියන් වහන්සේ ගැන සිතන, කථා කරන, යාච්ඤා කරන සෑම මොහොතකම දෙවිඳාණන් ගැන මහත් සැලකිල්ලකින්, ආදරයකින්, ගෞරවයකින් යුතුව කරන්නේ නම් දෙවියන් වහන්සේ වැඩි වැඩියෙන් අපගේ අත්දැකීම බවට පත් වේ. ඒ තරමට අපගේ විශ්වාසය වර්ධනය වෙනවා. ප්‍රේමයේ පොරොන්දු අපි අත්දකින්නට පටන් ගන්නවා. විශ්වාසයේ බලය කෙතරම්ද කියලා අප අත්දැකීමෙන් දැනගන්නවා.

(ආ) ද්විතීය නි.ස. 31:8 **"සමිඳාණන් වහන්සේම නුඹට පෙරටුව යන සේක. ඔවුන් වහන්සේ නුඹ සමග වැඩ සිටින සේක. ඔවුන් වහන්සේ නුඹෙන් අහක්ව යන්නේවත්, නුඹ අත්හරින්නේවත් නැත. ඒ නිසා බය නොවන්න. නොකැළඹෙන්න. "**

* මෙලෙස දේව පොරොන්දු වැඩි වැඩියෙන් අයිති කර ගනිමු. සාක්ෂි දරමින්, අන් අය හා විශ්වාසය ඵලදැරූ අත්දැකීම් බෙදා ගැනීමට උනන්දු වෙමු.

05. සතිය පුරා ප්‍රායෝගික වීමට :

* විශ්වාසය තුළින් අයිති කරගත් දේ ගැන අපි ප්‍රීතිවෙමු. සතුටුවෙමු.
* පෞද්ගලිකව ප්‍රීතිවීම පමණක් නොව, ඒ පිළිබඳව අන් අයට ප්‍රකාශ කරමු.
* යාච්ඤාවෙන් ඉල්ලූ දේ අයිති කර ගනිමින් විශ්වාසයේ චිත්‍රය සවිමත් කරගනිමු. එම සිහිනය ඉටුවන තුරු සමිඳාණන්ට තුති ප්‍රශංසා කරමු.
* විශ්වාසයේ පියවරයන් ගනිමින් අභ්‍යාස කරමු.

06. අවසාන යැදුම :

* විශ්වාසය ජීවමාන බව අත්දකින්නට අපව ආලෝකමත් කරන පිණිස, මඟපෙන්වන පිණිස, ශුද්ධාත්මයාණන්ගේ බලය පතා යාච්ඤා කරමු.
* විවිධාකාර දීමනා ඇතත් සිටින්නේ එකම ශුද්ධාත්මයාණෝය. ....ඇත්තෙන්ම ආත්මයාණන් තුළ විශ්වාසයද..... දී ඇත. (1කොරෙන්ති 12:4,9)

======================

ප්‍රශංසා එකතු සුපවත

2018 ජනවාරි මස 29 වන දින සිට පෙබරවාරි මස 03 වන දින දක්වා

**විශ්වාසය තේජාන්විත ගමනකි**

01. ප්‍රශංසාව සඳහා :

* වසර 40ක් පුරා දෙවියන් වහන්සේ ඊශ්‍රායෙල් ජනතාව විශ්වාසයේ ගමනක රැගෙන ගිය අයුරු අපි දනිමු. ගමන දුෂ්කර වුවද, අසීරු වුවද දෙවියන් වහන්සේ ඔවුන් සමග වැඩ සිටි බැවින් එම ගමන තේජාන්විත ගමනක් වූ සැටි ශු.ලියවිල්ල සාක්ෂි දරයි.

* නික්මයාම 13:21 **"සමිඳාණන් වහන්සේ දිවා කාලයේදී ඔවුනට මඟපෙන්වීමට වළාටැඹකින් ද, රාත්‍රි කාලයේදී ආලෝකය දීමට ගිනි ටැඹකින් ද ඔවුන්ට පෙරටුව ගිය සේක. මෙලෙස ඔවුන්ට දිවා රෑ දෙකෙහිම ගමන් කරන්නට හැකි විය."**

* කිතුනු අපගේ ජීවිතය විශ්වාසයේ ගමනකි. නොකඩවා, නොනැවතී උදේ හවා දිවා රැයේ යෙදෙන ගමනකි. ශුද්ධාත්මයාණන් වහන්සේ මෙලෙස නොනවතින ගමනක අපව රැගෙන යන සේක. විශ්වාසය නමැති තේජාන්විත ගමන තුළ අපව ඔසවා ගෙන යන සේක. අද දක්වාම අපව රැගෙන ආ සේක. අපගේ ස්තුතිය හා ප්‍රශංසාව ඔවුන් වහන්සේට මෙලෙස පුද කරමු.
* පුබුදු ගී අංක 160 "ඔසොවා යන සේ පැටවුන්...."

02. පසුගිය සතියේ අත්දැකීම් බෙදා ගනිමින් ප්‍රශංසා කරමු.

03. සතියේ සුපුවත :

* මළවුන්ගෙන් උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේව හමුවීමේ බලගතු අත්දැකීමත් සමග ශු.පාවුළුතුමා විශ්වාසයේ තේජාන්විත ගමන ආරම්භ කළේය. මන්ද සමිඳාණෝ අපට අයහපතින් යහපත උදා කරන සේක. ඒ පිළිබඳව මෙනෙහි කරමින් විශ්වාසයේ ගමන පිළිබඳව ඔබගේ අත්දැකීම කෙසේ දැයි මෙම ශු.ලියවිලි පාඨය මුල් කරගෙන බෙදා ගන්න.

* හෙබ්‍රෙව් 12:1-2 **" මේ සා විශාල සාක්ෂිකාර සේනාවකින් අප වට වී සිටින නිසා, සියලු අවහිරද, පහසුවෙන් අප වෙළා ගන්නා පාපයන් ද ඉවතලා, ඇදහිල්ලේ කර්තෘවරයාණන් ද එහි පරිපූරකයාණන් ද වන ජේසුස් වහන්සේ දෙසම නෙත් යොමා, අපට දිවීමට ඇති ධාවනය නොපසුබට වීර්යයෙන් දුවමු. ....."**
* ඉහත ශු.ලියවිලි පාඨය මෙනෙහි කිරීමට පාවුළු තුමාගේ ජීවිත අත්දැකීමද උදව් කරගන්න.

04. වචනයේ සේවකයා සඳහා :

* විශ්වාසය නමැති ගමනේ කර්තෘවරයාණන් ද, පරිපූරකයාණන් ද මෙන්ම පරමාදර්ශය වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේමය. පැරණි ගිවිසුමේ පටන් නව ගිවිසුම දක්වාම මෙම තෙජාන්විත ගමනේ පතාක යෝධයන් අපට දැකගත හැකිය. මේ සියල්ලන් අතර භාග්‍යවන්ත අම්මාගේ විශ්වාසය මුළු මහත් ලොවම, සඳහටම විශ්ම පත් කරවන සුළුය.

* විශ්වාසය යනු කුමක්ද? ගමනේ ස්වභාවය කුමක්ද? ගමන තේජාන්විත වන්නේ මන්දැයි මේ සියළු දෙනා තුළින් මගපෙන්වීමක් ද, ආලෝකයක් ද දැනටමත් ලැබී ඇත. විශ්වාසය යනු දෙවියන් වහන්සේට පූර්ණව යටත් වීමයි. තම කැමැත්ත පූර්ණව දෙවියන් වහන්සේට යටත් කිරීමයි.එය මෙසේ අර්ථකථනය කළ හැකිය. එනම් දෙවියන් වහන්සේ කුමක් කීවත් කොන්දේසි විරහිතව එය භාර ගැනීමයි. ඊට අවනත වීමයි. ශුද්ධාත්මයාණන් වහන්සේට ක්‍රියා කිරීමට ඉඩදීමයි.
* කුරුසියේ ගමන මොන අන්ධකාරයක්ද? කුරුස පාමුල මොන අන්ධකාරයක්ද?
* ශු.මාක් 15:33 **"මද්දහනේදී රට පුරා අන්ධකාරයක් පහළ විය. එය සවස 03.00 වන තෙක් පැවතිනි."**
* මෙසේ මිනිස් ජීවිතයේ සියළු යථාර්ථයන් මරණයෙන් කෙළවර වෙත්දී එතුමිය කුරුස පාමුල දක්වා පැමිණි ගමන, නව ජීවිතයක ගමන් මඟ අපට හෙළි පෙහෙළි කරන හිරු උදාවට පෙර පෑයූ තාරකාව වැනිය. විශ්වාසය තේජාන්විත ගමනකි. මේ බව අපි නිරතුරුවම සිහි තබා ගනිමු.

05. අවසාන යැදුම :

* විශ්වාසයේ ගමන මුල් කරගෙන, ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලය පතා යාච්ඤා කරන්න.
* පුබුදු ගී 294 "ගෙන යනු මැනවි මා ...."

********************